## BIO-BIN කොම්පෝස්ට් බඳුන භාවිතය සඳහා උපදෙස්

- මුළුතැන්ගෙය අවටින් සුදුසු උස් ස්ථානයක බඳුන ස්ථාපිත කර ගැනීම ඉතා වැදගත්.
- නිවසේ සිට අඩි 10 ක් වත් ඈතින් බඳුන ස්ථාපිත කිරීම සුදුසුවේ.
- ආලෝකය හොඳින් ලැබෙන ස්ථානයක බඳුන තබන්න.
- බඳුනේ සියළු කොටස් පහත රූප සටහන පරිදි නිවැරදිව සවිකර ගන්න.(**BIO-BIN** කණ්ඩායම විසින් මුල් වතාවේදී සවිකර දීම සිදු කරයි).
- අවම වශයෙන් මසකට වරක්වත් බඳුන තුළ ද්‍රව්‍ය මිශ්‍ර කරන්න.
- සෑම විටම බඳුන හොඳින් වසා තබන්න.
- හොඳින් නඩත්තු කරන ලද බඳුනක සවිකර මාස තුනකට පසු කොම්පෝස්ට් ඉවතට ගත හැකිය.
- සෑම සති දෙකකට වරක්ම කොම්පෝස්ට් ඉවතට ගන්න.
- එම කොම්පෝස්ට් ඔබේ ගෙවත්ත සඳහා භාවිත කරන්න.
- බඳුන තුළින් පිටවන වැඩි ජලය දියර පොහොරක් ලෙස භාවිත කළ හැක. එම දියරයට 1:5 අනුපාතයට ජලය යොදා පැලෑටිවලට ඉසින්න.
- කොම්පෝස්ට් ඉවතට ගන්නා විවර නිතරම වසා තබන්න.
- බඳුන අවට පිරිසිදුව තබාගන්න.
- උපදෙස් පරිදි අදාල ද්‍රව්‍ය පමණක් බඳුනට දමන්න.
- කිසිඳු විටික බඳුන තුළ ගිනි තැබීම සිදු නොකරන්න.




## BIO-BIN කොම්පෝස්ට් බඳුනේ විශේෂත්වය

- සවිමත් කොන්ක්‍රීට් වලින් නිමාව ඇති දිගුකල් පැවැත්ම.
- ප්ලාස්ටික් බඳුනට වඩා සාපේක්ෂව පරිමාවෙන් වැඩිවීම.
- පරිහරණයේ පහසුව සඳහා කොටස් කිහිපයකින් නිමවා තිබීම.
- කොම්පෝස්ට් ඉවතට ගැනීම සඳහා විවර දෙකක් තිබීම.
- කොන්ක්‍රීට් පතුල නිසා මීයන් වැනි සතුන්ට ඇතුල් වීමට නොහැක.
- අව්වට වැස්සට ඔරොත්තු දීම.
- පරිසර හිතකාමී අමුද්‍රව්‍ය භාවිතා කර නිමවා තිබීම.
- ගැල්වනයිස් පියන නිසා නඩත්තුව හා භාවිතය පහසුවීම.
- වායු පෝෂක සිලින්ඩරය නිසා ඇතුලත වාතාශ්‍රය වැඩිවීම හා තෙතමනය පාලනය වීම නිසා ජීර්ණ ක්‍රියාවලිය වේගවත් වීම.

## BIO-BIN කොම්පෝස්ට් බඳුන නිවස තුළ පිහිටුවීම හා පසුවිපරම් සේවාවන් ....

- සුළු ප්‍රවාහන ගාස්තුවක් යටතේ නිවසටම බඳුන ගෙනැවිත් සවිකර දීම.
- බඳුනේ ක්‍රියාකාරිත්වය සහ නඩත්තුව පිළිබඳ උපදෙස් ලබාදීම.
- කණ්ඩායම් වශයෙන් හෝ එකවර විශාල සංඛ්‍යාවක් ඇනවුම් කරන්නේ නම් විශේෂ මිල ගනන් යටතේ බඳුන් ලබාදීම.
- දිවයිනේ ඕනෑම ප්‍රදේශයකට ප්‍රවාහනය කර දීම.
- මාස තුනකට වරක් බඳුන පිළිබඳව පසුවිපරම් සිදුකිරීම.
- සීට්ටු ක්‍රමයට බඳුන් ලබාගත හැකි වීම.
- විශාල ප්‍රමාණයක් එකවර ඇනවුම් කරන අවස්ථාවල අදාල ස්ථානයේදීම බඳුන් නිෂ්පාදනය කරදීමේ හැකියාවක් පැවතිම.
- පාසල් සඳහා විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ප්‍රදර්ශනය සඳහා අලෙවි කුටි ඉදිරිපත් කිරීම.
- පලාත් පාලන ආයතන වෙත ඝණ අපද්‍රව්‍ය කළමණාකරන සේවා සැපයීම.
- නාගරික පර්යේෂණ සිදු කිරීම.
- බඳුන් අලෙවියෙන් ලැබෙන ලාභයෙන් කොටසක් ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණ කටයුතු සඳහා යෙදවීම.
- නාගරික කාබනික ගෙවතු නිර්මාණය සඳහා තාක්ෂණික සහාය ලබාදීම.


පීපල් ටු පීපල් වොලන්ටියර්ස්
අංක:22/ඒ, නයිවල, එස්සැල්ල, වේයන්ගොඩ.
විමසීම්: **071 7007771**


පීපල් ටු පීපල් වොලන්ටියර්ස් ආයතනයේ ප්‍රකාශනයකි.



Text written by: K.A.A.P. Kumara


# BIO-BIN

## IMPROVED HOME COMPOST BIN

### වැඩි දියුණු කළ
### ගෘහස්ථ කොන්ක්‍රීට් කොම්පෝස්ට් බඳුන










Manufactured & Distributors By
**PEOPLE TO PEOPLE VOLUNTEERS**
No.22/A, Naiwala, Essella, Veyangoda
Contact: 071 7007771

Email: peoplepeopleto@yahoo.com
Facebook: htttps://www.facebook.com/biobin.homecomposting

## BIO-BIN කොම්පෝස්ට් බඳුන ගැන ..........

දෛනිකව ජනනය වන කසළ නිවස තුළම කළමණාකරණය කිරීම සඳහා සාර්ථක විකල්පයක් ලෙස පීපල් ටු පීපල් වොලන්ටියර්ස් ආයතනය විසින් වැඩි දියුණු කළ **BIO-BIN කොම්පෝස්ට් බඳුන හඳුන්වා දේ.**

දැනට භාවිතයේ පවතින කොම්පෝස්ට් බඳුන්වල පවතින ගැටළු හා අඩුපාඩු හඳුනාගෙන ඒවාට සාර්ථක විසඳුම් සහිතව මෙම කොම්පෝස්ට් බඳුන නිර්මාණය කර ඇත.

**BIO-BIN** කොම්පෝස්ට් බඳුන සවිමත් කොන්ක්‍රීට් වලින් නිමවා ඇති අතර, හැසිරවීමේ පහසුව සඳහා එය කොටස් තුනකින් නිමවා ඇත. එක් එක් කොටස තුළ වා කවුළු යොදා ඇති අතර එක් කොටසක වා කවුළු 60 බැගින් මුළු බඳුන තුළ වා කවුළු 180 කින් යුතුව නිමවා ඇත. එහි මතුපිට හරිත වර්ණය අලේප කර ඇත.

බඳුන වසා තැබීම සඳහා ගැල්වනයිස් තහඩුවකින් නිමවන ලද කේතුවක හැඩය ගත් පියනක් ඇති අතර එය මතුපිට හරිත වර්ණ තීන්ත ආලේප කර ඇත. එම පියන පහසුවෙන් හැසිරවිය හැකි නිසා හා බඳුන තුළ ඇති ද්‍රව්‍ය මිශ්‍ර කිරීමට සහ බඳුන නිතර පරීක්ෂාකර බැලීමට ඉතාමත් පහසු වේ. එසේම වැසි ජලය බඳුන ඇතුළට කාන්දුවීම මෙම පියන නිසා වැලකේ. (කොන්ක්‍රීට් වලින් නිමවන ලද පියන සහිත බඳුන තුළ ද්‍රව්‍ය මිශ්‍ර කිරීම හා එය පරීක්ෂාකර බැලීම අපහසු වේ.)

බඳුනේ පහල කොටස තුළින් කොම්පෝස්ට් ඉවතට ගැනීම සඳහා කවුළු දෙකක් යොදා ඇති අතර, එම කවුළු වසා තැබීම සඳහා කුඩා දොරටු දෙකක් නිර්මාණය කර ඇත. බඳුන හා පොළොව අතර බඳුන තැබීම සඳහා කොන්ක්‍රීට්වලින් තැනූ පතුලක් නිමවා ඇත. එය පොළොව හා සම්බන්ධ කිරීම සඳහා කුඩා සිදුරු යොදා ඇත.

## BIO-BIN කොම්පෝස්ට් බඳුන තුළ දිරාපත්වීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සහ තෙතමනය පාලනය සඳහා ගෙන ඇති පියවර ....

**BIO-BIN** කොම්පෝස්ට් බඳුන තුළ දිරාපත්වීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සහ තෙතමනය පාලනය කිරීම සඳහා වැඩිදියුණු කළ කොම්පෝස්ට් බඳුන තුළ පියවර කිහිපයක් ගෙන ඇත.

බඳුන තුළ දිරාපත්වීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා ඒ තුළ හොඳ වාතාශ්‍රයක් පවත්වාගෙන යාම සහ තෙතමනය පාලනය කිරීම ඉතා වැදගත් අතර, ඒ සඳහා පහසුකරවන වායු පෝෂක සිලින්ඩරයක් බඳුන කේන්ද්‍රයේ සිට සිරස් අතට සවිකර ඇත.

එසේම එම උපාංගය හරහා බඳුන තුළ තෙතමනය පාලනය වන අතර වැඩි ජලය බඳුනෙන් පිටතට ගලා ඒම සිදුවේ. එම ජලය දියර පොහොරක් ලෙසද භාවිතයට ගත හැකිවේ. බඳුන තුළ තවදුරටත් වාතාශ්‍රය වැඩි කිරීම සඳහා බඳුන තුළ ද්‍රව්‍ය මිශ්‍ර කිරීම පහසු කරවන උපකරණයක් නිර්මාණය කර ඇති අතර, එමගින් බඳුන තුළ ඇති ද්‍රව්‍ය පහසුවෙන් මිශ්‍ර කල හැකිය.

කොම්පෝස්ට් බඳුන




ගැල්වනයිස් පියන







කොන්ක්‍රීට් පතුල

## BIO-BIN කොම්පෝස්ට් බඳුනට දැමිය හැකි දේවල් සහ නොදැමිය යුතු දේවල්

| BIO-BIN කොම්පෝස්ට් බඳුනට දැමිය හැකි දේවල් ✓ | BIO-BIN කොම්පෝස්ට් බඳුනට නොදැමිය යුතු දේවල් X |
|---|---|
| ▪ මුළුතැන්ගෙයි ඉවතලන එළවළු, පළතුරු කොටස් | ▪ පොලිතින්, ප්ලාස්ටික්, කඩදාසි වීදුරු ඇතුළු නොදිරන ද්‍රව්‍ය |
| ▪ ඉවතලන ආහාර කොටස් | ▪ සායනික අපද්‍රව්‍ය |
| ▪ ඉවතලන මස්, මාළු කොටස් | ▪ රසායනික අපද්‍රව්‍ය |
| ▪ කපා ඉවත්කරන අමු තණකොළ කොටස් | ▪ මස්, මාළු සෝදන ලද ජලය |
| ▪ කොස්කටු ආදිය දමන්නේ නම් කුඩාවට කපා දැමිය හැක | ▪ ඉවතලන පොල්තෙල් ඇතුළු තෙල් වර්ග, පොල් කුඩු |
| ▪ බිත්තර කටු | ▪ වියලි කොස් කොළ අඹ කොළ ආදි වියළි කොළ වර්ග |
| | ▪ ළමා සහ සත්ව අපද්‍රව්‍ය |



වැඩි ජලය පිට වන කොටස




කොම්පෝස්ට් බඳුන ඇතුළත සිලින්ඩරය

කොම්පෝස්ට් මිශ්‍රණ උපකරණය



